# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1348 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 20/08/2024 පැය 1415

## මාධ්‍ය නිවේදනය

### රගර් තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කරන ලද **ක්‍රීඩා සැණකෙළිය 2024.08.16 වන දින සිට 2024.08.18 වන දින දක්වා කොළඹ තුරග තරඟ පිටියේදී** පැවත්විණි. මෙහිදී රගර්, පාපන්දු, පැසි පන්දු, හොකී, ක්‍රිකට් යන තරඟ ඉසව් පැවැත්වූ අතර සත් සාමාජික රගර් තරඟාවලියේ "Cup" ශූරතාවය දිනා ගැනීමට පොලිස් රගර් A කණ්ඩායමද," Bowl " ශූරතාවය දිනා ගැනීමට පොලිස් රගර් B කණ්ඩාමයද සමත් විය.

මේ සඳහා ශ්‍රී ලංකා පොලිස් රගර් කණ්ඩායම සමඟ CRNFC, Havelock, CHNFC, ගුවන් හමුදා නාවික හමුදා සහ යුද්ධ හමුදා යන රගර් කණ්ඩායම් සහභාගී වූ අතර අවසන් මහා තරඟය සඳහා පොලිස් රගර් කණ්ඩායම සමඟ CRNFC කණ්ඩායම තරඟ වැදිණි. එහිදී පොලිස් රගර් කණ්ඩායම ගෝල් 10 ට 17 ක් ලබා ගනිමින් ජයග්‍රහණය කිරීමට සමත් විය.

මෙම තරඟ ජයග්‍රහණය ශ්‍රී ලංකා පොලිස් රගර් ඉතිහාසයේ වසර 35කට පසු ලබා ගත් සත් සාමාජික රගර් තරඟ ශූරතාවයකි.

ශ්‍රී ලංකා පොලිස් රගර් සභාපති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රන්මල් කොඩිතුවක්කු, ලේකම් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ලලිත් ලීලාරත්න, කමිටු සමාජික පොලිස් අධිකාරී අජන්ත රොද්‍රිගු, සහකාර පොලිස් අධිකාරී චින්තක පෙරේරා මීට පෙර ලේකම් ධූරය දැරූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිසාම් ජමල්ඩීන්, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ලක්ෂ්මන් අබේකෝන්, විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නෙරංජල අබේවර්ධන, පොලිස් රගර් කණ්ඩායමේ කළමනාකරු පොලිස් පරීක්ෂක එස්.එම්.එස්. සමරකෝන් යන මහත්වරුන්ගේ අධීක්ෂණය සහ මඟ පෙන්වීම යටතේ මෙම ජයග්‍රහණය සඳහා කණ්ඩාම නිසි පරිදි පුහුණු වීම් කටයුතු සිදු කර ඇත.

පොලිස් රගර් කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු ලෙස නිලූප ඊබ්‍රහීම්, ශාරීරික අභ්‍යාස පුහුණුකරු ලෙස පොලිස් පරීක්ෂක හෂාන් ගෝමස් යන මහත්වරුන් කටයුතු කරනු ලබයි.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප




Dialog
POLICE
10
GORDONE
POLICE
02







**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**